www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### සසජාශි/සසප යුද්ධයට එරෙහි හදිසි සමුලුවේ දී සම්මත කරගත් යෝජනාව

# ඉරාකයේ වාඩි ලා ගැනීම නතර කරනු ! ඉරානයට එරෙහිව යුද්ධයක් එපා ! යුද්ධයට එරෙහිව ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් සඳහා !

**Resolution adopted by the ISSE/SEP Emergency Conference Against War**
**End the occupation of Iraq! No to war against Iran! For an international socialist movement against war!**

**2007 අප්‍රේල් 04**

*මිචිගන් නුවර ඈන් ආබර්හි දී මාර්තු 31 හා අප්‍රේල් 01 දිනවල සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ/සමාජවාදී සමානතා පක්ෂය පැවත්වූ යුද්ධයට එරෙහි හදිසි සමුලුවේ දී පහත දැක්වෙන යෝජනාව අප්‍රේල් 01 දා ඒකමතිකව සම්මත කරගන්නා ලදී. යුද්ධයට එරෙහිව නව්‍ය වූ අරගලයක් සඳහා අවශ්‍ය වන දේශපාලන පදනම පිලිබඳව සමුලුවේ ආස්ථානය මෙයින් දැක්වෙයි.*

1. සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ/සමාජවාදී සමානතා පක්ෂ යුද්ධයට එරෙහි සමුලුව ලෝකය පුරා ශිෂ්‍යයන්ගෙන් හා කම්කරුවන්ගෙන් ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ යුද්ධයන්ට සහ ඉරානයට එරෙහි මිලිටරි ප්‍රහාරයන්ගේ තර්ජනයට එරෙහිව අරගලය තීව්‍ර කරන ලෙස ඉල්ලා සිටී.

2. සමුලුව පැවැත්වනුයේ 2003 මාර්තු 20 දා දියත් කල ඇමරිකාවේ නීති විරෝධී ඉරාක ආක්‍රමනයෙන් සිව් වසරකට පසුව ය. මෙම සිව් වසර ඉරාක ජනතාවට නිමක් නැති මරනයේ සහ විනාශයේ බියකරු සිහිනයක් විය. බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාවක් වන ලැන්සට් පල කල ජෝන් හොප්කින්ස් සරසවියේ අධ්‍යයනයකට අනුව 2006 ජූනි වන විට ආක්‍රමනය හේතුවෙන්, තක්සේරු ගත 655,000 ඉරාක ජාතිකයන් මරා දමා තිබේ. බොහෝ දෙනා තුවාල ලැබූ අතර සමස්ත සමාජය ම අලාපාලුවී ගොසින් ය. ඇමරිකානු සහ අනෙකුත් සොල්දාදුවන් 3,400 ඉක්මවන පිරිසක් මරනයට පත්ව 25,000කට ආසන්න පිරිසක් තුවාල ලැබූ හ.

3. ඉරාකයට විරුද්ධ යුද්ධය අධිරාජ්‍යවාදී යුද්ධයකි. එය ඇමරිකාවේ සංගත හා මූල්‍ය කතිපයාධිකාරයේ ද බ්‍රිතාන්‍යයේ සහ අනෙකුත් රටවල එහි සංගතයන්ගේ ද අවශ්‍යතාවයන් වෙනුවෙන් කරගෙන යන ආක්‍රමනශීලී ක්‍රියාවකි. විසි වන සියවසේ යුද්ධවලින් මෙන් ම සිදු වෙමින් පවතිනුයේ ඇමරිකානු පාලක පන්තිය, ප්‍රධාන මූලෝපායික කලාපයන්ගේ මිලිටරි පාලනය තහවුරු කර ගැනීමට මාන බලන අතර වාරයේ ගෝලීය සම්පත් යලි බෙදා ගැනීම ය. නිෂ්පාදනයේ වැඩි වැඩියෙන් සිදුවන ගෝලීය ඒකාග්‍ර කරනය ධනපති පද්ධතිය ඓතිහාසිකව මුල් බැස තිබෙන යල් පිනූ ජාතික රාජ්‍ය රූපාකාරයේ සීමාවන් හා ගැටෙයි. එම ප්‍රතිවිරෝධය වඩවඩා කුඩා වන පාලක පන්තියක් විසින් නිෂ්පාදන මාධ්‍යයන් පෞද්ගලිකව සියත තබා ගැනීම සහ දස කෝටි ප්‍රමාන ශ්‍රමිකයන් සම්බන්ධ වන නිෂ්පාදන ක්‍රියාවලියේ සමාජ ස්වරූපය අතර ගැටුම තීව්‍ර කරයි.

4. අධිරාජ්‍යවාදී යුද්ධයේ පලමු ඉලක්කය ඉරාකය නොවන අතර ධනපති ක්‍රමය පෙරලා නොදමුව හොත් එය අවසාන ඉලක්කය ද නොවනු ඇත. තවමත් විසි එක් වන සියවසෙන් දශකයක් වත් ගෙවී ගොස් නැතත් කම්කරු පන්තියේ මැදිහත් වීමක් නොවුනහොත් පසු ගිය සියවසේ බේදවාචකයන් සහ ලේවැකි අපරාධ යලි සිදුවන බව පමනක් නොව ඒවා ඉක්මවා යන දේ ද සිදුවන බව දැනටමත් ඉතා ම පැහැදිලි වී තිබේ. පසු ගිය දශක දෙක මුලුල්ලේ, ඉරාකයේ පලමු ආක්‍රමනයේ සිට සෝමාලියාවට සහ සර්බියාවට එරෙහි යුද්ධ දක්වා ද ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය යටත් විජිත මාදිලියට ආක්‍රමනය කර වාඩිලා ගැනීම දක්වා ද, ලෝකය ඇමරිකානු මිලිටරිවාදයේ ව්‍යාප්තියට එක දිගටම ලක්ව තිබේ.

5. 2003 පෙබරවාරියේ දී ලොව පුරාම දස ලක්ෂ ගනන් ජනයා ඇමරිකානු යුද සැලසුම්වලට එරෙහිව වීදි බැස ගත් හ. සිව් වසරකට පසුව ද ජනතා විරෝධය තීව්‍ර වෙද්දී පවා යුද්ධය ඇදී යයි. යුද්ධය නිමා කිරීමට ඇති එකම මාවත තිබෙනුයේ සමාජවාදී වැඩපිලිවෙලක් මත පදනම් වූ ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඒකාබද්ධ දේශපාලන ව්‍යාපාරක් හරහා ය. ලොව සම්පත් පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීමට සහ සංගත ලාභයන් වෙනුවෙන් නොව දැවෙන සමාජ අවශ්‍යතා සැපිරීමට භාවිතා කල හැකි වන අයුරු ලොව නිෂ්පාදන සම්පත් ලෝක ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය පාලනය යටතේ තැබිය යුතු ය.

## ඉරාකය සහ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ගෝලීය මූලෝපාය

6. යුද්ධය වෙනුවෙන් ඉදිරිපත් කල සියලු යුක්තිසහගත කිරීම් - අල්කයිඩාව සමග ඉරාකයට සබඳතා ඇතැයි කීම සහ සමූල ඝාතක අවි ඇතැයි කීම ඇතුලුව - දිගු කලකට ඉහතදී ම මුසාවාද බව එළිදරව් විය. මෙම මුසාවන් පෙරට දැමූ බුෂ් පරිපාලනයේ සිටියවුන් ඇතුලුව එයට ඒකාබද්ධ වූ අනෙකුත් ආන්ඩුවල, මාධ්‍යවල සහ ඩිමොක්‍රැටික් පක්ෂයේ ඔවුන්ගේ සහායකයන් ද යුද අපරාධ පිලිබඳව වැරදිකරුවෝ වෙති. ඔවුන්ට කිසි දා සිය අත්වල තිබෙන ලේ පැල්ලම් සෝදා හැරිය නොහැක.

7. ජාත්‍යන්තර සමාගම් සඳහා රටේ ඛනිජ තෙල් විවෘත කරන මෙන් ඇමරිකාව තුල දේශපාලන සංස්ථාපිතයෙන් ඉරාක ආන්ඩුවට වන එකාවන් ඉල්ලීම යුද්ධයේ කොල්ලකාරී ස්වභාවය ඉතාම පැහැදිලිව එළිදරව් කරයි. එහෙත්, මෙම යුද්ධය දියත් කිරීමේ දී ඇමරිකානු පාලක පන්තියේ එල්ලය වූයේ ඉරාකයේ තෙල් භූමි අල්ලා ගෙන මිලිටරි බලය හරහා මැදපෙරදිග සිය ආධිපත්‍යය ස්ථාපිත කර ගැනීම පමනක් නොව, සිය ප්‍රධාන අධිරාජ්‍යවාදී තරගකරුවන් සමග තරගයේ දී තමන්ට ඇති අත්වාසිය ඉහල දමාගැනීම සහ සිය ගරා වැටෙන ආර්ථික බලය යලි තහවුරු කර ගැනීම ද වේ.

8. 2003 ඉරාක ආක්‍රමනය ඉරාකයේ ද මුලුමහත් මැද පෙරදිග ම ද ඇමරිකාවේ දිග්ගැස්සුනු යාන්ත්‍රනයන්ගේ නව අදියරක් නියෝජනය කරයි. මෙම පිලිවෙත වැඩිවැඩියෙන් ම ඍජු මිලිටරි මැදිහත්වීම්වල සහ නව යටත් විජිතවාදයේ රූපය ගත්තේ ය. ඒවා නම්, 1991 ගල්ෆ් යුද්ධයෙන් කුලුගැන්වී, එක්සත් ජාතීන් හා ක්ලින්ටන් පරිපාලනය අධීක්ෂනය කල දොලොස් වසරක මාරාන්තික සම්බාධක සහ අවසානයේ 2003 ආක්‍රමනය ය.

9. මෙම කලාප තුල ඍජු ඇමරිකානු මිලිටරි ආධිපත්‍යයක් දෙසට ගමන් කිරීමේ මූලයන් පවතින්නේ ඇමරිකානු ආර්ථික ආධිපත්‍යය ඛාදනය වීම තුල ය. ඇමරිකානු ධනවාදය රැඳී සිටින්නේ; දැවැන්තව ප්‍රාග්ධනය ගලා ඒම, පෙර නුවූ විරූ මට්ටමක වන නය සහ විවිධාකාරයේ මූල්‍ය සමපේක්ෂනයේ හා උපාමාරු දැමීමේ අබල දුබල අස්ථාවර පදනමක ය. ඇමරිකාවේ දූෂිත වූ පාලක ප්‍රභූවක් සිය ගරා වැටෙන ආර්ථික බලය යලි නැංවීමට තමන් සතු ප්‍රධාන වත්කම - සෙසු ලෝකයේ සියලු රටවල යුද වියදම් එකතුව ඉක්මවා යන වියදමක් තුලින් පවත්වාගෙන යන සන්නද්ධ බලකා - භාවිතා කිරීමට වැඩි වැඩියෙන් මාන බලයි.

10. ඇමරිකානු අධිරාජ්‍යවාදයේ උවමනාවන් මැදපෙරදිගට හා මධ්‍යම ආසියාවට සීමා වී නොමැති අතර දකුනු හා මධ්‍යම ඇමරිකාව, අප්‍රිකාව, ආසියාව සහ යුරෝපය ඇතුලු ලෝක ගෝලයේ හැම අස්සක් මුල්ලක් කරා ම දිව යයි.

11. පලමුවන හා දෙවන ලෝක යුද්ධවල අතිශය ලේවැකි දිනයන්ගෙන් අනතුරුව නුදුටු විරූ ලෙස ගෝලීයව ප්‍රචන්ඩකාරීත්වය පුපුරා යාමත් සමග මනුෂ්‍යත්වය තර්ජනයට ලක්ව තිබේ. ඇමරිකාවේ ගෝලීය අභිලාෂයන් 20 වන සියවස මුල් භාගයේ ජර්මානු අධිරාජ්‍යවාදයේ අභිලාෂයන්ගෙන් සාමයට එල්ල වූ අන්තරායට වඩා වැඩි අන්තරායක් පෙන්නුම් කරයි. යුද්ධයේ මූලික හේතුව පවතින්නේ ඇමරිකානු පාලක පන්තියේ අභිලාශවල නොව ප්‍රතිගාමී ධනපති ජාතික රාජ්‍ය පද්ධතියෙන් අනිවාර්යයෙන් පැන නගින භූ දේශපාලනය සහ ආර්ථික ආතතීන් තුල ය. ව්‍යාප්තවාදී භූ දේශපාලනික උවමනාවන් තුල යෙදී සිටින්නේ ඇමරිකාව පමනක් නොවේ. සම්පත් සඳහා විවිධ ධනපති බලවේගයන් අතර - ඇමරිකාව, ජපානය, ඕස්ට්‍රේලියාව, රුසියාව සහ යුරෝපා බලවතුන් ඇතුලුව - තරගයත් සමග ම අන්තර් අධිරාජ්‍යවාදී සතුරුකම් උත්සන්න වී තිබේ. බොහෝ සුලු බලවතුන්ට ඔවුන්ගේ ම කලාපීය උවමනා සහ අභිලාෂ පවත්නා අතරතුරේ චීනය හා ඉන්දියාව ඇතුලු ඓතිහාසිකව පීඩිත රටවල පාලක පන්ති වඩා අධිපති ලෝක තත්වයක් සඳහා මහත් පරිශ්‍රම දරමින් සිටී. ලොව ගිනි අවුලුවාලීමේ අනතුර උත්සන්න කිරීමට මේ සියල්ල එකතු වී සිටී. නව ලෝක යුද්ධයක අනතුරට පිලිතුරු දිය හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී ලෝක සමාජවාදී සමාජයක් ස්ථාපිත කිරීම දෙසට යොමුවුන ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඒකාබද්ධ ගෝලීය අරගලයකින් පමනකි.

## යුද්ධය හා සමාජ අසමානතාව

12. පසු ගිය දශක තුන මුලුල්ලේ ජාත්‍යන්තර සමාජ සබඳතාවල ප්‍රධාන ප්‍රවනතාව වූයේ, සමාජ අසමානතාවයේ අසාමාන්‍ය වර්ධනය සහ ජනගහනයේ තුනී ස්තරයක දෑත් මත ධනය සංකේන්ද්‍රනය වීම ය. මෙම ක්‍රියාවලිය අන් කිසිදු තැනකට වඩා ඇමරිකාවේ පැහැදිලිව පෙනේ.

13. මිලිටරිවාදය සමාජ අසමානතාවට අංශ දෙකකින් අවියෝජනීයව බැඳී තිබේ. 1) යුද්ධය කම්කරුවන්ගේ පිට මතින් ඉසුරුමත් වූ පාලක පන්තියේ ම සමාජ උවමනාවන්ගේ ප්‍රකාශයකි. , සහ 2) සමාජ ආතතීන් තීව්‍ර වන විට, අභ්‍යන්තර ගැටුම් යට ගැසීමටත් ඒවා ඉවතට යොමු කිරීමටත් පාලක පන්තිය විසින් යුද්ධය භාවිතා කරයි.

14. දේශීය ආදායම් සේවාවේ බදු දත්තයනට අනුව ඇමරිකාව තුල සමාජ අසමානතාවය මහා අවපාතයට පෙර, 1928න් පසුව එන, ඉහල ම අගයේ පවතී. සම්බන්ධයෙන් ඇමරිකානු ජනගහනයෙන් ධනවත්

ම සියයට එකේ ඉහලම දහයෙන් පංගුව (300,000 දෙනා) දුප්පත්ම ඇමරිකානුවන් කෝටි 15ක මුලු ආදායම් එකතුවට වඩා වැඩි ආදායමක් ලබයි. 1970 ගනන් සිට ජනගහනයේ බහුතරයේ ආදායම එකතැන පල්වෙමින් හෝ පහල වැටෙමින් තිබෙන අතරේ ඉහල ම සියයට 1 ආදායම තියුනුව ඉහල නැග තිබේ. ආදායම් වර්ධනයේ ඉහල ම මට්ටම් ජනගහනයෙන් ධනවත්ම සියයට 1න් ඉහල සියයයෙන් පංගුව තුල සංකේන්ද්‍රනය වී තිබේ.

15. ජාත්‍යන්තරව ගත් කල ලෝක ජනගහනයේ පෝසත් ම සියයට 1 පහලම සියයට 10ට සමාන ආදායමක් ලබයි. - පෝසත්ම පුද්ගලයින් තිදෙනා සතු වත්කම් දුප්පත්ම කෝටි 60ක ජනයා සතු වත්කම්වලට වඩා වැඩි ය. ඉහල ම කෝටිපතියන් 946 දෙනා සතු වත්කම් 2006 වසර තුල දී සියයට 35කින් එනම් ඩොලර් ට්‍රිලියන 3.5කින් වැඩි වී ඇති අතර මෙම වැඩි වීම සමස්ත අප්‍රිකානු මහාද්වීපයේ දල ජාතික නිෂ්පාදිතයන්ට වඩා ඩොලර් ට්‍රිලියනයකින් වැඩිය.

16. අසමානතාවයේ වර්ධනයට පෙර කාලයන්හි දී කම්කරුවන් දිනාගත් දේ මත ක්‍රමානුකූලව එල්ල කෙරෙන ප්‍රහාරයන් ද ඇතුත් වෙයි. ඇමරිකාවේ, කැනඩාවේ, යුරෝපයේ, ඕස්ට්‍රේලියාවේ සහ අනෙකුත් ධනපති බලවතුන්ගේ රටවල් තුල සමාජ වැඩපිලිවෙලවල් මුලිනුපුටා දමමින් තිබේ. වැඩියෙන් අසංවර්ධිත කලාපවල ජාතික ප්‍රතිසංස්කරන සහ ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ සූරා කෑමට එරෙහි ආරක්ෂන ඉවත් කර දමමින් තිබේ.

17. විදේශවල සිය අධිරාජ්‍යවාදී යුද්ධ කරගෙන යාමේදී ඇමරිකානු පාලක ප්‍රභූව තමන් බිල්ලට යොදා ගන්නා කම්කරුවන්ට හා තරුනයන්ට සලකනු ලබන්නේ පූර්න අවඥාවෙනි. "අපගේ භටයන්ට සහයෝගය දෙන්න" යන මන්තරයේ තිබෙන අතිශය කුහක බව තුවාල ලබන ඇමරිකානු සොල්දාදුවන්ට සහ යුද ප්‍රවීනයන්ට දෙන අවප්‍රමානිත වෛද්‍ය ප්‍රතිකාර සහ අන් පහසුකම්වලින් හෙලිදරව් වේ. ඉරාක ආක්‍රමනය නිසා මිලිටරිය තුල ඇති වී තිබෙන ආතතිය හේතුවෙන්, ඇමරිකානු යුද යන්ත්‍රයට නව භටයන් සපයා ගැනීම පිනිස බලෙන් බඳවා ගැනීම යලි හඳුන්වා දීම කරන ලෙස ඉල්ලීමට පාලක පන්තියේ සමහර කොටස් යොමු කරවා තිබේ. අධිරාජ්‍යවාදයේ යුද උනසන්නිපාතය සියලු අධිරාජ්‍යවාදී රටවල කම්කරුවන් මත ඉහල යන ව්‍යසනකාරිත්වයක් පටවනු ඇත.

18. දස කෝටි ගනන් ජනයා දුගීබවේ හා රෝග පීඩාදියේ ගිලී සිටිය ද ලොව තාක්ෂනයේ අතිඅසාමාන්‍ය සංවර්ධනයක් පෙන්නුම් කරයි. ලෝක ජනගහනය ගෝලීය උනුසුම වැනි පාරිසරික ගැටලු නිසා අපහසුතාවයට පත්ව සිටී. මෙම ගැටලු නිරාකරනයට සම්පත් තිබුන ද ඒවා පෞද්ගලික ධනය ගොඩගසා ගැනීමට වියරු වැයමක නිරත දූෂිත බලාධිකාරයක සහ ලාභ ලුහුබැඳීමට අන් සියල්ල යටපත් කර දමන සමාජ පද්ධතියක රාමුව තුල සිරවී තිබේ.

19. යුද්ධයට විරුද්ධ අරගලය එයට යටින් පවතින දේශපාලන හා සමාජ උවමනාවන්ට විරුද්ධ වීමෙන් වෙන් කල නොහැක. යුද්ධයට එරෙහි අරගලයේ මධ්‍ය කේන්ද්‍රය සමාජ අසමානතාවයට එරෙහි සටන සහ රැකියා, යහපත් වැටුප්, යහපත් නිවාස, සියලුදෙනාට සෞඛ්‍ය ආරක්ෂනය සහ අධ්‍යාපනය සහතික කරන සමාජයක් ස්ථාපිත කිරීම විය යුතු ය.

## යුද්ධය සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත ප්‍රහාරය

20. සමාජ අසමානතාවය හා මිලිටරිවාදය අවසානයේ දී ප්‍රජාතන්ත්‍රීය රාමුවක පාලනය සමග එක්ව නොයයි. ඇමරිකානු පාලක පන්තිය විසින් නායකත්වය දෙදු ලබන අති මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි තොග ගනනේ වන ප්‍රහාරය ඔවුන්ගේ මිලිටරිවාදයේ හා සමාජ ප්‍රතිගාමීත්වයේ ප්‍රතිපත්තිවලට එරෙහිව මතුවන අනිවාර්ය ප්‍රතිරෝධයට දක්වන ප්‍රතිචාරයකි.

21. ඇමරිකානු පාලක ප්‍රභූව විසින් කෝකටත් තෛලය සේ භාවිතා කරන ඊනියා "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" අති දැවැන්ත වංචාවකි. සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් වසර හතර හමාරක් ගතවීත් එම සිදුවීම් පිලිබඳව සහ ඇමරිකානු ආන්ඩුවේ රහස් සබඳතා පිලිබඳව වැදගත් සාක්ෂ්‍ය ගැන කිසිදු විශ්වාස කටයුතු පරීක්ෂනයක් කර නැත.

22. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" පලමු පලවිපාකවලින් එකක් වූයේ අති මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත පෙර නුවූ විරූ ප්‍රහාරයකි. එය ඇමරිකානු දේශප්‍රේමී පනත සම්මත කිරීමේ සිට දේශීය ඔත්තු බැලීම දැවැන්තව ප්‍රසාරනය කිරීම, ස්වදේශ ආරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටුවීම, රහස් සීඅයිඒ රැඳවුම් කඳවුරු පිහිටුවීම සහ කුප්‍රකට ගුවන්තනාමෝ බේ බන්ධනාගාරය දක්වා වෙයි. ඇමරිකානු ආන්ඩුව ජොසේ පැඩිලාගේ සිද්ධියේ දී මෙන් ඇමරිකානු පුරවැසියන් ඇතුලු ඕනෑ ම කෙනෙකු අත්අඩංගුවට ගැනීමට හා රඳවා ගැනීමට චෝදනා නොමැතිව අසීමිත කලකට රඳවා තැබීමට සහ වධ බන්ධනයට ලක් කිරීමට තමන්ට අයිතිය තිබෙන බව ප්‍රකාශ කලේ ය. මේ සියල්ල " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" නාමයෙනි. 2006 අවසන් භාගයේ දී කොන්ග්‍රසය ද්වි පක්ෂ එකඟතාවය ඇතිව හදිසි මිලිටරි කොමිෂන් සභා පිහිටුවීමට සහ වධදීමෙන් ලබාගත් සාක්ෂ්‍ය භාවිතයට අවසර දීමට සහ ගුවන්තනාමෝ රැඳවියන්ට හබියාස් කෝපුස් මූලික අයිතිය අහිමි කිරීම සඳහා නීති පැනවීය.

23. ඇමරිකාවේ ඒකාධිපති පාලනයක් දෙසට වන මෙම චලනය සමස්ත ලෝකවාසීන්ට මාරාන්තික

තර්ජනයක් එල්ල කරයි. ඇමරිකානු පාලක ප්‍රභූවේ උවමනාවන්ට විරුද්ධ වන හෝ අභියෝග කරන ඕනෑ ම කෙනෙකුට එරෙහිව ඒවා භාවිතා කරනු ඇත.

24. ඉරාකයේ යුද්ධයමත් ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ අසමත්කමේ ව්‍යසනකාරී ප්‍රකාශනයකි. එය දියත් කලේ ඇමරිකාවේ ද ලොව පුරාම ද දැවැන්ත ජන විරෝධයකට මුහුන දෙමින් මුසාවාද පදනම් කරගෙන ය. 2006 නොවැම්බරයේ මධ්‍යවාර මැතිවරනයේ දී ඇමරිකානු ජනයා යුද්ධය නැවැත්වීම වෙනුවෙන් ඡන්දය දුන් නමුත් ඒ වෙනුවට ඔවුන්ට ලැබුනේ මිලිටරි උත්සන්නියකි.

25. ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර දීම ජාත්‍යන්තර ප්‍රපංචයකි. ඕස්ට්‍රේලියාවේ "ත්‍රස්තවාද විරෝධී පනත", ජර්මනියේ "ගුවන් සේවා ආරක්ෂාව පිලිබඳ පනත", බ්‍රිතාන්‍යයේ "ත්‍රස්තවාද පනත් කෙටුම්පත", ශ්‍රී ලංකාවේ "ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත" යන මේ සියලු විධාන සහ ලොව පුරා රටවල් ගනනාවක තවත් බොහෝ දේ ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර දීමට සම්මත කර ගෙන තිබේ.

26. මේ වෙනස් වෙනස් රටවල පාලක ප්‍රභූන් ජනයාගේ මූලික අයිතිවාසිකම් ඔවුන්ගේ ජනප්‍රිය නොවන පිලිවෙත් කරගෙන යාමට බාධාවක් ලෙස දකිති. ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර දීමට එරෙහිවීම ධනපති පද්ධතියට එරෙහිවීම මත පදනම් විය යුතු ය. මෙම අයිතීන් ආරක්ෂා කිරීම, සමාජ සහ ආර්ථික ජීවිතය ප්‍රජාතන්ත්‍රීය ලෙස පාලනය කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රීය ලෙස සහභාගිවීමේ හැකියාව ප්‍රසාරනය කිරීමක් සමග එකට සිදුවිය යුතු ය. මෙය සිදු කල හැක්කේ ජාත්‍යන්තර සමාජවාදය ස්ථාපිත කිරීමෙනි.

## ජාත්‍යන්තරවාදය

27. මෙම පිලිවෙත්වලට විරුද්ධ වී යුද්ධය අවසන් කිරීමට හැකි බලවේගයක් තිබේ. ඒ ලෝක ජනගහනයෙන් අති මහත් බහුතරය වන ජාත්‍යන්තර කම්කරු පන්තිය ය. සිය සමාජ උවමනාකම් අධිරාජ්‍යවාදය යටින් පවතින සමාජ උවමනාවන්ට සමහන් කල නොහැකි ලෙස එරෙහි වන, ජනතාවගේ එකම කොටස කම්කරු පන්තිය යි. එසේම කම්කරු පන්තිය, සිය සමාජ උවමනාවන් තරගකාරී ජාතික රාජ්‍යයන්ගේ ධනපති පද්ධතියේ කොටු පවුරු හරහා ගමන් කරන එකම අව්‍යාජ ජාත්‍යන්තර පන්තිය ය.

28. ඇමරිකානු අධිරාජ්‍යවාදය මිලිටරිවාදයේ වර්ධනය සම්බන්ධයෙන් එකම වරදකරුවා නොවේ. වෙනත් රටවල ප්‍රභූවන් තමන්ගේ උවමනාකම් මිලිටරි බලය හරහා හඹා යාමට තැත් දරා තිබේ. සියලු ප්‍රධාන ධනපති බලවතුන් ඉරාක ආක්‍රමනයට එක්කෝ සහය දී නැතහොත් පහසුකම් සලසා දී තිබේ. මෙම තැන්වලින් ඇමරිකානු පිලිවෙතට විරුද්ධත්වය නැඟ ආවේ යම්තාක් දුරකට ද ඒ මැද පෙරදිග තුල ද ඇතුලුව ආරක්ෂා කරගැනීම සඳහා ඔවුන්ගේ ම උවමනාවන් පවත්නා බැවිනි.

29. ඉරානය, චීනය සහ ඉන්දියාව වැනි ආර්ථිකව අඩු දියුනුවක් සහිත රටවල පාලක ප්‍රභූවන්ට තමන්ගේ ම උවමනාවන් සහ අතලොස්සක් පවතින අතුරු ඒවා කම්කරු පන්තියේ උවමනාවන්ට පරිපූර්නව සතුරුව පිහිටනවා පමනක් නොව, මෙම උවමනාවන් හා අධිරාජ්‍යවාදයට එරෙහි ප්‍රතිපත්තිමය විරුද්ධත්වය අතර කිසිදු සම්බන්ධයක් නැත. මෙම රටවලට එරෙහිව සිදු කෙරෙන යුද්ධවලට විරුද්ධවීම මගින් ඒවායේ ආන්ඩුවලට හෝ එම ආන්ඩු නියෝජනය කරන ධනවාදී උවමනාවන්ට සහාය දීමක් කිසිදු ලෙසකින් නොහැඟවේ. මෙම රාජ්‍යයන් විසින් න්‍යෂ්ටික හෝ වෙනත් ආයුධ අත්පත් කර ගැනීම තුලින් අධිරාජ්‍යවාදය පරාජය කිරීම සිදු නොවන අතර එය කල හැක්කේ සමාජවාදී වැඩ පිලිවෙලක පදනම මත ජාත්‍යන්තර කම්කරු පන්තිය මෙහෙයවීම හරහා ය.

30. කම්කරුවන් ජාත්‍යන්තරව මුහුන දෙන ගැටලුවල මූලයේ පවතින්නේ ආර්ථික ගෝලීය කරනය සහ ධනපති ජාතික රාජ්‍ය පද්ධතිය අතර වඩවඩාත් තීව්‍රවන ගැටුමයි. ධනපති රාජ්‍ය සහ කල්ලි අතර තරගකාරිත්වය විසින් කම්කරු පන්තියේ ජීවන තත්වයන් මත අන් කවරදාටත් වඩා වැඩි ප්‍රහාරයන් මෙන් ම ස්වාභාවික සම්පත් පාලනයට එකිනෙකා අතර කා කොටා ගැනීම් ද අවුලුවා ලයි. කම්කරු පන්තිය විසින් නවතනු ලැබුවේ නැතිනම් මෙම සතුරුකම් අවසානයේ දී අතිමහත් ව්‍යසනකාරී මට්ටම්වල ලෝක ව්‍යාප්ත ගැටුමකට මග පාදනු ඇත.

31. ගෝලීය නිෂ්පාදන බලවේග යල් පිනූ ජාතික රාජ්‍ය පද්ධතියක සීමා ඇතුලත සීමා කිරීමට වෑයම් දැරීම ප්‍රතිගාමී මෙන්ම මනෝරාජික ද වෙයි. අධිරාජ්‍යවාදයේ ගෝලීය මූලෝපායට කම්කරු පන්තියේ ගෝලීය මූලෝපායකින් සහ ජාතිකවාදයේ සියලු ම රූපාකාරයන්ට එරෙහි විරුද්ධත්වයකින් මුහන දිය යුතු ය.

## කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සහ සමාජවාදය සඳහා අරගලය

32. ලොව පුරා කම්කරුවන් සහ තරුනයන් මෙම වැඩ පිලිවෙල සඳහා සටන් කිරීමේ දී මහජන විරෝධතාව දේශපාලන සංස්ථාපිතයේ පහසු දෝනාවලට යොමු කිරීමට ඒ හෝ මේ අයුරින් වෑයම් කරන පක්ෂ හෝ ප්‍රවනතාවලට ප්‍රතිවිරුද්ධව, කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා වන අරගලය මත පාදක විය යුතු ය.

33. මෙහි අර්ථය වනුයේ ඩිමොක්‍රැටික් පක්ෂයෙන් සහ ඩිමොක්‍රැටික්වරුන්ට බලපෑම් දැමීමට තැත් කරන

සියල්ලන්ගෙන් පරිපූර්නව බිඳී වෙන්වීම ය. ආක්‍රමනයට සූදානම් වීමේ සිට ඉතාම මෑත යුද්ධය උත්සන්න කිරීම දක්වා ම ඩිමොක්‍රැටික් පක්ෂය බුෂ් පරිපාලනයේ අපරාධ සහායකයාගේ චරිතය රඟපෑවේ ය. ඩිමොක්‍රැටික් පක්ෂය අධිරාජ්‍යවාදයේ ධනේශ්වර පක්ෂයක් වන අතර එයට ඇමරිකාව යුද්ධයට කැඳවාගෙන යාම පිලිබඳව - පලමු ලෝක යුද්ධය, දෙවන ලෝක යුද්ධය, කොරියාව සහ වියට්නාමය ඇතුලත්ව - දීර්ඝ ඉතිහාසයක් තිබේ. අද පක්ෂ නායකත්වයේ සියලු ම කොටස් - විවෘත ප්‍රතිගාමීන්ගේ සිට අනුචිතව නම් ලද "ඉරාකයෙන් ඉවත්වීමට හඬතගන කන්ඩායම" දක්වා - යුද්ධය පවත්වාගෙන යාම පිලිබඳව වගකිව යුතු ය. ඩිමොක්‍රැටික් පක්ෂයේ ප්‍රධාන උත්සුකය වන්නේ සමාජ විරෝධතාව සමහන් කිරීමට හා ද්වි පක්ෂ ක්‍රමයෙන් කැඩී එන ව්‍යාපාරයක් වර්ධනය වීම අඩාල කර දැමීමට යන්තමින් සෑහෙන ලෙසට සිය ප්‍රසිද්ධ ස්ථාවරයන් ඔසවා තැබීමට ය.

34. කොංග්‍රසය තුල ඩිමොක්‍රැටික්වරුන්ගේ හාස්‍ය දනවන සහ කුහක ඉදිරිපත් කිරීම් වන බල රහිත යෝජනා සහ ඈත අනාගතයේ දිස්වන අවසන් දින පිලිබඳව ඇස්බැන්දුම, යුද්ධය උත්සන්න කිරීමට බිලියන් ගනන් ඩොලර් සම්පාදනය කර දෙන 'යුද විරෝධී' යයි කියන යෝජනා සම්මත කිරීම සහ ඩිමොක්‍රැටිකයන්ගේ ද උදව් ඇතිව මරනයට යැවුනු ඇමරිකානු සොල්දාදුවන්ගේ ඉරනම පිලිබඳව කිඹුල් කඳුලු හෙලීම වැනි දේ කම්කරුවන් ප්‍රතික්ෂේප කල යුතු ය. ඩිමොක්‍රැටිකයන්ට අවශ්‍යව ඇත්තේ වාඩි ලා ගැනීම දිගට ම පවත්වා ගන්නා අතරේ අනාගත යුද්ධ සහ මැදිහත්වීම් සඳහා මිලිටරිය ගොඩනගා ගැනීමට අවකාශ සලසන 'යුද විරෝධී' ප්‍රතිපත්තියකි. ඩිමොක්‍රැටික්වරු සහ රිපබ්ලිකන්වරු අතර හෝ පක්ෂ දෙක ඇතුලත හෝ මත භේද පවත්නේ උපායික මාර්ග සම්බන්ධයෙන් පමනි. එනම් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා හඹා යා හැකි හොඳම ක්‍රමය පිලිබඳව ය.

35. සියලු රටවල කම්කරුවෝ මේ හා සමාන දේශපාලන ගැටලුවලට මුහුන දෙති. කැනඩාවේ ලිබරල් පක්ෂය සහ නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂය, ඕස්ට්‍රේලියානු ලේබර් පක්ෂය, ප්‍රන්සයේ හා ස්පාඤ්ඤයේ සමාජවාදී පක්ෂ සහ ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යන වාමාංශික යයි කියා ගන්නා මෙම සියලු සංවිධාන එක්කෝ දක්ෂිනාංශික සහ මිලිටරිවාදී පිලිවෙත්වලට සහාය දුන්හ: නැතහොත් ඒවා ඍජුව ම ක්‍රියාවට නැංවූහ. ඔවුහු කිසිදු අයුරකින් ජනතාවගේ අති බහුතරයේ උවමනාවන්ට දේශපාලන ප්‍රකාශනයක් ලබා නොදුන්හ.

36. යුද්ධයට එරෙහි ව්‍යාපාරයක් ලොව පුරා එක් එක් රටවල දේශපාලන ස්ථාපිතයේ මුක්කු ලෙස සේවය කරන ප්‍රවනතාවයන්ට - හරිත පක්ෂයේ සිට ප්‍රධාන යුද විරෝධී පෙලපාලිවලට නායකත්වය දුන් සංවිධාන, ප්‍රන්සයේ ලීගා කොමිනිස්තේ රෙවොලුෂනා සහ ඉතාලියේ කොමියුනිස්ට් රිෆවුන්ඩේෂන් වැනි නාමික සමාජවාදී සහ කොමියුනිස්ට් ප්‍රවනතා දක්වා- විරුද්ධව ද පදනම් විය යුතු ය. මෙම ප්‍රවනතාවයන් විසින් මහජන විරෝධතාවය ධනේශ්වර ආන්ඩු පිටුපස ගාල් කරමින් හෝ වෙනිසියුලාවේ හියුගෝ චාවේස් වැනි ධනේශ්වර ජාතිකවාදීන් සතුව ඇතැයි කියන විප්ලවවාදී අක්තපත්‍ර උත්කර්ෂයට නගමින් කම්කරු පන්තිය ස්වාධීන ව මෙහෙයවීමට බාධා කරති. පාලක පන්තිය සහ එහි ඒජන්තයන්ට බලපෑම් දැමීමට වෑයම් කිරීම මත පදනම්වන සාවද්‍ය 'එක්සත්'කම වෙනුවෙන් තර්ක කරන සියලු දෙනාට ම විරුද්ධවීම අවශ්‍යය.

37. ජාත්‍යන්තරව සරසවිවල සහ පාසල්වල සමාජවාදය සඳහා සටන සරසවිවල ආධිපත්‍යය දරන දෘෂ්ටිවාදමය සහ දේශපාලන ප්‍රවනතාවන්ට - පශ්චාත් නූතනවාදයේ බංකොලොත් ඉදිරිදර්ශනය හා අනන්‍යතා දේශපාලනය ඇතුලු - විරුද්ධව පදනම් විය යුතු ය. ශිෂ්‍යයන් දේශපාලන සංස්ථාපිතයට බලපෑම් දැමීම එල්ල කර ගත් විරෝධතා දේශපාලනයේ පුහු බව පෙන්වා දෙන ඉතිහාසයේ පාඩම් හැදෑරිය යුතු ය. තරුන ශිෂ්‍යයන් අතර සමාජවාදය සඳහා සටන ඇරඹිය යුතු වන්නේ ශිෂ්‍යයන් මුහුන දෙන ගැටලු - යුද්ධයේ සහ මිලිටරියට බඳවා ගැනීමේ තර්ජනය, ටියුෂන් ගාස්තු ඉහල යාම, ශිෂ්‍ය නය පුපුරා යාම, ගුනාත්මක රැකියා නැතිවීම ඇතුලු - ගෝලීය ධනවාදයේ අර්බුදයෙන් වෙන් කල නොහැකි බව වටහාගෙන ය. අද කම්කරුවන්ගේ ඉහල යන අනුපාතයක් පාසල් හෝ සරසවි අධ්‍යාපනය ලබන අතර ශිෂ්‍යයෝ ඉහල යන අනුපාතයක් රැකියා කරති. ශිෂ්‍යයන්ගේ ව්‍යාපාරයක් සමස්තයක් ලෙස කම්කරු පන්තියේ සමාජවාදී දේශපාලන ව්‍යාපාරයක් සඳහා සටන් කල යුතු ය.

38. කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනතාවය සඳහා වන සටනට විප්ලවවාදී ජාත්‍යන්තර සමාජවාදයේ ඉතිහාසය - මාක්ස් සහ එංගල්ස් සිට රුසියානු විප්ලවය, අද හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙන් නියෝජනය වන ස්ටැලින්වාදයට සහ සංශෝධනවාදයට එරෙහි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අරගලය දක්වා - දැනුවත්ව උකහා ගැනීම අවශ්‍ය කරයි.

39. මෙම සමුලුව ලොව පුරා කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් යුද්ධයට සහ ධනවාදී පද්ධතියට එරෙහි අරගලය මෙහෙයවනු පිනිස සමාජවාදී සමානතා පක්ෂය සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, එහි ශිෂ්‍ය සංවිධානය වන සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ සමග ගොඩ නංවන ලෙස ඉල්ලා සිටී.

© www.wsws.org